පරිවර්තනයක් (Summarized and Annotated Translation) ලෙස පාලි ග්‍රන්ථ සමාගම මගින් ප්‍රකාශයට පත් කර ඇත. එහි පරිවර්තකයා විසින් දෙන ලද ග්‍රන්ථ නාමයෙන් පිටකත්-තෝ-ස-මුයින්හි විස්තර වන කෘතිවල විවිධත්වය පැහැදිලි වෙයි. මෙම විශ්වකෝෂ ලිපිය ලියන ලේඛකයා විසින් පිටකත්-තෝ-සමුයින් කෘතියේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් ලන්ඩන්හි පාලි ග්‍රන්ථ සමිතියෙහි කළමනාකාර විලියම් පෲට් (William Pruitt) විමසන ලද අතර බුරුම පාලි සාහිත්‍යය පිළිබඳ උගතකු වන එතුමා සඳහන් කළේ බුරුම බසින් පිටකත්-තෝ-ස-මුයින් නම් වූ කෘතියේ නාමය ඉංග්‍රීසි බසින් A History of the Collection of Texts (ග්‍රන්ථ සමුච්ච ඉතිහාසය) යනුවෙන් පරිවර්තනය කිරීම සුදුසු බවයි. කෙසේ නමුත් මෙම කෘතිය එකිනෙකට මදක් වෙනස් වූ විවිධ නම්වලින් දක්නා ලැබෙන බව පෙනේ. භික්ඛු ඤාණතුසිත විසින් සිය පාලි මූලාශ්‍ර සටහනෙහි පිටකත් ථමයින් හා පිටකත් සමුයින් යන නම්වලින් මෙම කෘතිය හඳුන්වා දී ඇත (Nyanatusita, Bhikkhu, *An Analysis of the Pal Canon Edited by Russell Webb and A Reference Table of Pali Literature Compiled by Bhikkhu Nyanatusita,* Buddhist Publication Society: Kandy, 2011. 191).

ඇන්ග්ලෝ-බ(ර්)මානු යුද්ධයේ අවසානයේ සිදු වූ විනාශ හා කොල්ලකෑම් නිසා පිටකත්-තෝ-සමුයින් ලිවීමට ආරම්භ කරන විට මණ්ඩලේ පැරණි රාජකීය පුස්තකාලයට බොහෝ හානි සිදු ව තිබූ අතර එහි ග්‍රන්ථ බොහොමයක් ද ඉවත් කර තිබිණි. මේ නිසා ජේයාසූරගේ කෘතියට එහි තිබූ සියලු කෘති අන්තර්ගතවී නැති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සම්භාවනීය බුරුම ලේඛකයන්ගේ ඇතැම් කෘති ජේයාසූරට මගහැරී තිබේ. කෙසේ නමුත් 'පිටකත්-තෝ-සමුයින්' පූර්ව යටත්විජිත යුගය වන විට බුරුමයේ පැවැති පාලි සාහිත්‍ය කෘති පිළිබඳ හොඳ වැටහීමක් ලබා ගැනීමට අතිශයින් ම වැදගත් වන කෘතියකි. පිටකත්-තෝ-ස-මුයින් පාලි කෘතිවල කර්තෘ හා කාලය ආදි කරුණු පිළිබඳ ප්‍රමාණවත් විස්තර සහිතව ලියා ඇති හෙයින් (Hazra, K.L., *Pali Language and Literature: A Historical Survey and Historical Study* (Vol 2), D.K. Printworld (p) Ltd: New Delhi, 1932. 673-4) බුරුමයේ පාලි සාහිත්‍යය හැදෑරීමේ දී මෙම කෘතියෙන් ලැබෙන පිටිවහල සුළුපටු නොවේ. විශේෂයෙන් මේ තේමාව යටතේ මීට පෙර පාලි බසින් ලියා ඇති ගන්ධවංසයේ හෝ බුරුම ඉතිහාස ග්‍රන්ථයක් වූ සාසනවංසයේ පවතින ඒ ඒ ග්‍රන්ථ පිළිබඳ කර්තෘ කාලාදි විස්තරවල ඌනතා බොහොමයක් ජේයාසූර විසින් මගහරවා ගෙන ඇත. මේ නිසා පිටකත්-තෝ-සමුයින් පාලි සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ පඬුවන්ගේ නොමද අවධානයට ලක් වූ බව ඔවුන්ගේ කෘතිවලින් පෙනේ.

ලන්ඩන්හි පාලි ග්‍රන්ථ සමිතිය මගින් ඉංග්‍රිසි බසට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කර ඇති කෘතියට අනුව පිටකත්-තෝ-ස-මුයින්හි ග්‍රන්ථ 2047ක් ගැන විස්තර දක්වා ඇති අතර එකී ග්‍රන්ථ කාණ්ඩ වශයෙන් කාණ්ඩ 36කට අයත් ය. එහි විස්තර සඳහන් වන පාලි ග්‍රන්ථ අතර 323ක් පිටක ග්‍රන්ථ, අටුවා ග්‍රන්ථ, ටීකා ග්‍රන්ථ හා අටුවා හා ටීකාවල සංක්ෂේප ග්‍රන්ථ (ලක්-සාන්) ද වේ. මේ ග්‍රන්ථ අතර බුද්ධඝෝෂ හිමියන්ගේ අටුවා ඇතුළු ලාංකීය හා තායි භික්ෂූන්ගේ කෘති ද වේ. නව ටීකා, ගණ්ඨිපද, අත්ථයෝජනා, දීපනී, විලාසිනී, විභාවිනී යන නම්වලින් හැඳින්වෙන අටුවා හා ටීකාවල අර්ථවිවරණ කෘති ගණනාවක් ද ඇතුළුව කෘතියෙහි විස්තර දක්වා ඇති පිටක හා ඒවායේ විවරණ ග්‍රන්ථ (Exegeses) මුළු සංඛ්‍යාව 462කි. ආගමික නොවන අනෙක් පාලි ග්‍රන්ථ අතර ඉතා විශේෂ කොට සැලකිය හැක්කේ ව්‍යාකරණ ග්‍රන්ථ වන අතර ඒවා ගණනින් 71කි.

පිටකත්-තෝ-සමුයින් හා ජේයාසූර විසින් කළ අනෙක් කෘති හා එම කෘති සංඛ්‍යාව පිළිබඳ විමසීමේ දී ඔහු බුරුම සාහිත්‍යයේ මෑත ඉතිහාසයේ ඉතා වැදගත් ලේඛකයකු ලෙස සිය නාමය සනිටුහන් කර ඇති බව වෙසෙසා කිව යුතු කරුණක් නොවේ. එහෙත් ඔහුගේ චරිතයේ උදාරත්වය පැහැදිලිව පෙනෙන්නේ පිටකත්-තෝ-සමුයින් කෘතිය රචනා කිරීමට හේතුභූත වූ පසුබිම විමසා බැලීමේ දී ය. ජේයාසූර මිය ගියේ 1892 දී ය. ඒ වන විට ඔහු හැත්තෑ හත්වැනි වියේ පසු විය. 1886 දී පිටකත්-තෝ-සමුයින් රචනා කිරීමට ආරම්භ කරන විට ජේයාසූරගේ වයස අවුරුදු 69කි. එබඳු

වයෝවෘද්ධ සමයක දී ශතවර්ෂ ගණනක සාහිත්‍ය ඉතිහාසයේ ග්‍රන්ථ දහස් ගණනක විස්තර සහිත සූචියක් සකස් කිරීමට ඔහු පෙළඹුණේ කවර හේතුවක් නිසා ද යන්න විමසා බැලීම මෙහි දී වැදගත් වේ.

ඇන්ග්ලෝ-බර්මානු යුද්ධය අවසානයේ හා පූර්ව බර්මානු යටත්විජිත සමයේ ඉංග්‍රීසීන් විසින් බුරුම ජාතිකයන්ගේ අතිමහත් ජාතික වස්තු විනාශ කිරීමත් කොල්ලකෑමත් සිදු කරන ලදි. රාජකීය පුස්තකාලයට ද හානි පැමිණ තිබූ බව ඉහතින් දක්වන ලදි. ආසියානු රටවල් ආක්‍රමණය කිරීමෙන් පසු බටහිර ජාතීන් විසින් ඔවුන්ගේ රටවලට ගෙන යන ලද භාණ්ඩ අතර යටත්විජිත රාජ්‍යයන්හි ආගමික හා පාරම්පරික ඥානය ලියවී තිබූ පැරණි ග්‍රන්ථවල අත්පිටපත්වලට ද ප්‍රමුඛ ස්ථානයක් ලැබිණි. ජෙයාසූර පිටකත්-තෝ-සමුයින් ලිවීමට ආරම්භ කරන විටද රාජකීය පුස්තකාලයේ බොහෝ කෘති අතුරු-දහන් ව තිබිණ. මෙසමයෙහි සිය ජාතික උරුමයන් විනාශ වන අයුරු දැකීමෙන් ඇති වූ සංකාව හා වේදනාව විසින් බුරුම ජනයා පීඩා විඳි බව ඉතා පැහැදිලි ය. බෞද්ධ බුරුම වැසියන් විසින් සිය ජීවිතයට වඩා උත්කෘෂ්ට කොට සැලකූ බුදුසමයේ පරම පූජනීය වස්තු විනාශ වීම සිය දෙනෙත් ඉදිරියේ දක්නා ලද නමුත් එහිලා ඔහුට දැක්විය හැකි ප්‍රතික්‍රියාවක් නොවී ය. මෙකී ඛේදනීය තත්ත්වය තුළ ඒ වන විට වයෝවෘද්ධ ලේඛකයකු වූ ජෙයාසූර මෙහෙයවන ලද්දේ විනාශ මුඛයට යමින් තිබූ බුරුම ජනයාගේ අසමසම උරුමයක් වූ සාහිත්‍ය ග්‍රන්ථාවලිය පිළිබඳ නාමමාත්‍ර හෝ මතකයක් ඇති කර ගැනීමට උපකාර වන ග්‍රන්ථයක් සකස් කිරීමට ඔහුගේ උසස් ජාතික හා ආගමික හැඟීම විසින් ඇති කරනු ලැබූ බලපෑම බව නිසැක ය.

[අනුග්‍රහය : බුරුම ජාතික ආචාර්ය කම්මායි ධම්මසාමි හිමි (ඔක්ස්ෆ(ර්)ඩ් විශ්වවිද්‍යාලය), ආචාර්ය විලියම් පෘට් (පාලි ග්‍රන්ථ සමිතියේ කළමනාකාර හා පාලි භාෂා විශේෂඥ)]

මිරිස්වත්තේ විමලඥාණ හිමි

**ජෙරබොවම්** (Jeroboam). 'ජනතාව වර්ධනය වේ' යන අරුත ගෙන දෙන 'ජෙරබොවම්' නමින් වූ රජවරුන් දෙදෙනකු ගැන ශුද්ධවූ බයිබලයේ සඳහන් වේ.

1. ජෙරබොවම් I (ක්‍රි.පූ. 932-912)
2. ජෙරබොවම් II (ක්‍රි.පූ. 783-743)

**ජෙරබොවම් I :** සොලමොන් රජතුමා විසින් ඊප්‍රහිම් (Ephrhim) ගෝත්‍රිකයන්ගෙන් වරිපනම් අය කරන්නෙක් වශයෙන් පත්කරනු ලැබූ (3 kings 11/26) ජෙරබොවම්ට පැවරුණු මෙම රාජකාරිය නිසා ජනතාව මුහුණ දුන් ගසාකෑම්, තාඩන, පීඩන, භීෂණ, දූෂණ ගැන මනා අවබෝධයක් ලබා ගැනීමට ඔහුට හැකි විය. ජනතාව කලකිරීමට පත් වී සිටියේ, සොලමොන් රජතුමා නොනැවත ඉදිරියට ගෙන ගිය ඔහුගේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති නිසා බැව් ජෙරබොවම්ට අවබෝධ කර ගැනීමට වැඩි කලක් ගත නොවී ය.

ජෙරබොවම්ට දිනක් අහියාස් (Ahias) නම් දිවැස් ප්‍රසාදිවරයකු හමුවිය. අහියාස් තම කබාය කැබලි 12කට ඉරා, කැබලි 10ක් ජෙරබොවම්ට දී මෙසේ කීය. ඔබගේ රාජ්‍යය කොටස් දෙකක් පමණක් සොලමොන් රජතුමාගේ පුත්‍ර රත්නයට ඉතිරි වන අතර, ඔබ කොටස් 10ක් හිමි නායකයා බවට පත් වන බැවින් මේ ලැබීමට ඉවසීමෙන් සිටිය යුතු ය.

තමාට රාජකීය කිරුළ උරුම වන බැව් ඇසූ සැණින් ජෙරබොවම් නොඉවසිලිවන්ත විය. සොලමොන් රජ පෙරළා දැමීමට කුමන්ත්‍රණයක් දියත් කළ ඔහුට ඊජිප්තුවට පලා යාමට සිදුවිය. ඊජිප්තුවේ පාරාවෝ රජ ඔහුව සතුටින් බාරගෙන ඔහුට ඊජිප්තියානු කුමරියක ද සරණ පාවා දුන්නේ ය (3 Kings 11/29-40).

ක්‍රි.පූ. 932 සොලමොන් රජතුමාගේ මරණයෙන් පසු ජෙරබොවම් I පෙරළා පලස්තීනු දේශයට පැමිණි නමුත්, ඔහුට එරෙහි වූ රොබොආම් (Roboam) නමැත්තෙක් විය. දේශපාලන හා ආගමික වශයෙන් ද රට තුනට බෙදිණ. අහියාස්ගේ අනාවැකිය සනාථ විය. ජෙරබොවම් බේතෙල් (Bethel) නම් අන් දෙවියකුට වන්දනා කරමින් සිටිය දී තමාට අවවාද කිරීමට පැමිණි අහියාස් දිව්‍ය ප්‍රසාදිවරයා අල්ලා මරා දැමීමට දිගු කළ ජෙරබොවාම්ගේ අත ක්ෂණිකව අප්‍රාණික වී සොලවන්නට බැරි සේ ගල් ගැසිණි. පසුව අහියාස් දිව්‍ය ප්‍රසාදිවරයාගේ යැදුමෙන් එය සුව විණි. (3 Kings